## ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

## මධ්‍යම ආදායම් නිවාස සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා කඩිනම් වැඩසටහන

# පුරප්පාඩු

රජය විසින් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවයේ නියුතු මධ්‍ය ආදායම්ලාභී පවුල් සඳහා දිවයින පුරා මහල් නිවාස ඉදිකිරීම සඳහා වූ සුවිශේෂී වැඩපිළිවෙලක් දියත් කර තිබේ. මෙම නිවාස ඒකක උපනාගරික ප්‍රදේශවල බොහෝ දුරට අධිවේගී මාර්ග සහ මහාමාර්ග ආශ්‍රිත ප්‍රධාන සංධිස්ථාන ආසන්නව ඉදිවේ.

මෙම වැඩසටහන ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය ලෙස කටයුතු කරනු ලැබේ.

මෙම වැඩසටහන සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය හා අධීක්ෂණය සඳහා ව්‍යාපෘති සම්බන්ධීකරණ ඒකකයක් ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇත.

ඒ අනුව ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතේ වූ මධ්‍ය ආදායම් නිවාස සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා කඩිනම් වැඩසටහන් සඳහා වූ වැඩසටහන් සම්බන්ධීකරණ ඒකකයේ පහත සඳහන් තනතුර සඳහා සුදුසු ශ්‍රී ලාංකිකයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. ව්‍යාපෘති ලේකම් (තනතුරු සංඛ්‍යාව - 1) - PS6 (A කාණ්ඩය)

වැඩසටහන් සම්බන්ධීකරණ ඒකකය ක්‍රමවත්ව පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා ඔහු හෝ ඇය ව්‍යාපෘති ලේකම් තනතුරට අදාළව මෙන්ම ව්‍යාපෘති පරිපාලනය සම්බන්ධ පූර්ණ සහාය ලබා දිය යුතුය. ඉංග්‍රීසි හා සිංහල භාෂා (ලිඛිත හා වාචික) ප්‍රවීණත්වය, අන්තර් පුද්ගල සම්බන්ධතාවය සහ ඉහළ පරිගණක සාක්ෂරතාවය මෙම තනතුර සඳහා පූර්ව අවශ්‍යතාවයන් වේ.

**අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද (පහත 1 හෝ 2)**

01. අ.පො.ස. සා/පෙළ ඉංග්‍රීසි හා සිංහල / දෙමළ භාෂාව ඇතුළු විෂයන් හයකින් (06) සමත්විත හා ඉන් ඉංග්‍රීසි හා සිංහල / දෙමළ භාෂාව යන විෂයන් ඇතුළුව විෂයන් තුනක් සඳහා සම්මාන සාමාර්ථ ලබා තිබීම හා පිළිගත් ආයතනයකින් ලේකම් තනතුරට අදාළ පාඨමාලාවක් හදාරා තිබීම හෝ පිළිගත් ආයතනයකින් වරලත් ලේකම් තත්ත්වය ලබාගැනීම සඳහා උපකාරී වන්නා වූ පාඨමාලා හදාරා තිබීම සමග අවම වශයෙන් වසර හයක අදාළ තනතුරේ පළපුරුද්ද.
02. වරලත් ලේකම්වරයකු වීම හා අවම වශයෙන් අවුරුදු පහක් (5) වරලත් ලේකම් තනතුරේ පළපුරුද්දක් ලබා තිබීම.

**වයස් සීමාව :** අවුරුදු 50 ට අඩු විය යුතුය.

**වැටුප් පරිමාණය :**

මූලික වැටුප රු. 67,000.00/- සිට රු. 73,000.00/- දක්වා (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 හි විධිවිධාන අනුව)

**අයදුම් කිරීමේ ආකාරය :**

අයදුම්කරුවන් විසින් තම ජීව දත්ත හා තමාව නිර්දේශ කිරීමට යෝජිත ඥාති නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ නම් ඇතුළත්ව සකස්කරගත් අයදුම්පත්‍රයක් අධ්‍යාපන සහ සේවා පළපුරුද්ද දක්වන සහතිකවල පිටපත් සමග ලියාපදිංචි තැපෑලෙන් 2021 නොවැම්බර් මස 20 දිනට හෝ ඊට ප්‍රථම පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.

"වැඩසටහන් අධ්‍යක්ෂ, මධ්‍යම ආදායම් නිවාස හා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා කඩිනම් වැඩසටහන, තැ.පෙ. 1826, 9 වන මහල, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ගොඩනැගිල්ල, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02"

ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන ලද තනතුර සඳහන් කරන්න. රජයේ / අර්ධ රාජ්‍ය අංශයේ සිටින අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානී මගින් තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතු අතර, අයදුම්පත් නියමිත වේලාවට ලබාදීම සහතික කිරීම සඳහා තම ආයතන ප්‍රධානී සහතික නොකළ අනු පිටපතක් එවීමට උපදෙස් දෙනු ලැබේ.

**වැඩසටහන් අධ්‍යක්ෂ,**
**තැ.පෙ. 1826, 9 වන මහල,**
**ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ගොඩනැගිල්ල,**
**ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,**
**කොළඹ 02.**
**2021 නොවැම්බර් මස 03 දින.**